රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
**Ministry of Public Administration and Management**
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

| | | |
|---|---|---|
| දුරකතන<br>தொலைபேசி: (94) 011-2696211-13<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல் (94) 011-2695279<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல் secretary@pubad.gov.lk<br>E-mail |

---

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No } 75/10/පොදු(තාව) | ඔබේ අංකය<br>உமது இல<br>Your No } | දිනය<br>திகதி<br>Date } 2016.06.08 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **10/2015(II)** අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහනය ලැබූ නිළධාරීන් සඳහා විලම්භනය වූ වැටුප් වර්ධක නැවත ගෙවීම.</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2015(II) මගින් අංක: 1842/2 හා 2013.12.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ නව ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගත් නිළධාරීන්ට පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම සඳහා විභාග වාර 06 ක සහනයක්ද, අංක: 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගත් නිලධාරීන්ට පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමට විභාග වාර අවස්ථා 06 ක සහනයක්ද දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා විභාග වාර අවස්ථා 12 ක සහනයක්ද ලබා දී ඇත.

02. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2015(II) අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සහන හිමිවන නිළධාරීන් සඳහා අදාල පරිදි විලම්භනය කරන ලද වැටුප් වර්ධක ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජේ. දඩල්ලගේ
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.